# පළාත් සභා නිවේදන

යොමු අංකය : වා/පස/2/1/19(26)

## වයඹ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2002 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධනය) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2003.09.16 වැනි දින සම්මත කරනු ලදුව, 2003.09.26 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

එස්. හිරිමුතුගොඩ,
ලේකම්,
වයඹ පළාත් සභාව

2003 නොවැම්බර් මස 03 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2002 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය (වයඹ ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය 2003.09.26)**

2000 අංක 3 දරන ප්‍රඥප්තියෙන් සහ 2001 අංක 2 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම පිණිස ද, වයඹ පළාතේ පළාත් සභාවේ විපක්ෂයේ සංවිධායකවරයාට වැටුප් දීමනා ගෙවීම උදෙසා විධිවිධාන සැලැස්වීම පිණිස ද එකී ප්‍රඥප්තිය තවදුරටත් සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය*

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2002 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

*වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම*

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන ප්‍රඥප්තියෙහි දීර්ඝ නාමයෙහි 'සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට හා පක්ෂනායකවරයාට' ද යන වචන වෙනුවට "සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට, ආණ්ඩුපක්ෂයේ සංවිධායකවරයාට විපක්ෂනායකවරයාට හා විපක්ෂයේ සංවිධායකවරයාට" ද යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය සංශෝධනය කිරීම*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එය සංශෝධනය කෙරෙන අතර, එය (ඇඇ) ඡේදය වශයෙන් බලපැවැත්විය යුතුය.

"(ඇඇ) වයඹ පළාතේ පළාත් සභාවේ විපක්ෂයේ සංවිධායකවරයාට ගෙවිය යුතු මාසික වැටුප සහ දීමනා තත්කාලයෙහි වයඹ පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකුට ගෙවනු ලබන වැටුප් හා දීමනා සහ මසකට රුපියල් එක්දහස් පන්සියයක අතිරේක දීමනාවකට සමානවද"

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය සංශෝධනය*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තියෙහි "සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට, ආණ්ඩුපක්ෂයේ සංවිධායකවරයාට සහ විපක්ෂනායකවරයාටද" යන වචන වෙනුවට 'සභාපතිවරයාට, නියෝජ්‍ය සභාපතිවරයාට, සභානායකවරයාට, ආණ්ඩුපක්ෂයේ සංවිධායකවරයාට, විපක්ෂනායකවරයාට සහ විපක්ෂයේ සංවිධායකවරයා' ට ද යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

5. මෙම ප්‍රඥප්තියෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.